**05-05-2022 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ බාබාගේ ශ්‍රීමත් අනුගමනය කරනා විට, කිසිම කෙනෙක්ට ඔබව දුකට පත්කළ නොහැකියි. රාවණ් තමයි ඔබට දුක් දෙන්නේත්, ඔබව නොයෙකුත් අපහසුතාවයන්ට ලක් කරන්නේත්. නමුත්, ඔහු ඔබගේ රාජ්‍යයට එන්නේ නැහැ.

**ප්‍රශ්නය:** මේ දැනුම නම් වූ යාගයේදී දරුවන් බිල්ලට දෙන්නේ මොනවාද?

**පිළිතුර:** මේ දැනුම් යාගයේදී ඔබ බාර්ලි හෝ තිරිඟු ඇට බිල්ලට දෙන්නේ නැහැ. ඔබගේ ශරීරයත් ඇතුළුව ඔබ තමා ළඟ ඇති සියලුම දේ කැප කළ යුතුයි. එනම්, ඔබ සෑම දෙයක්ම ඔබගේ බුද්ධියෙන් ඉවතට දැමිය යුතුයි. පාරිශුද්ධත්වය රකිනා බ්‍රහමිණ් දරුවන්ට පමණයි මෙම අග්නි යාගය ගෙන යා හැක්කේ. පිරිසිදු බ්‍රහමිණ්වරුන් බවට පත්වන අය තමයි දේවතාවන් බවට පත්වන්නේ.

**ගීතය:** ඔබ සොයා ගැනීමෙන්, අපි සියල්ලක්ම සොයා ගත්තෙමු. පොළව, අහස සියල්ලම අයිති අපටයි...

ඕම් ශාන්ති. දරුවන් පියා ළඟට පැමිණ සිටිනවා. ඔහු පියා බව අනිවාර්ය ලෙසම හඳුනාගත්තායින් පසුවත්, පිළිගත් පසුවත් ඔවුන් පැමිණෙනු ඇත. එසේ නැතිනම්, ඔවුන්ට මෙහි පැමිණිය නොහැකියි. තමා ඒ අසීමිත වූ අශාරීරික පියා වෙත යන බව දරුවන් වටහා ගන්නවා. ඔහුගේ නම ශිව බාබායි. ඔහුට තමාටම කියා ශරීරයක් නැහැ. කිසිම කෙනෙක්ට ඔහුගේ සතුරා බවට පත්විය නොහැකියි. මෙහි විරුද්ධවාදීකම් තිබෙනා විට පාලකයන් මැරුම් කනවා. ගාන්ධීට ශරීරයක් තිබුණු නිසා ඔහු මැරුම් කෑවා. බාබාට තමාටම කියා ශරීරයක් නැහැ. ඔවුන් මා මරා දැමීමට උත්සාහ කළත්, ඒ මරන්නේ මා ඇතුළුවන ශරීරයයි. කිසිම කෙනෙක්ට ජීවයක් මරාදමන්නවත්, තුවාල සිද්ධ කරන්නවත් බැහැ. මා ඒ රාජ්‍යය නම් වූ වාසනාව ලබා දෙන්නේ මා නිවැරදි ලෙස හඳුනා ගන්නා අයටයි. එම රාජ්‍යයේ වාසනාව කිසිම කෙනෙකුට පුළුස්සා දැමිය හැකි දෙයක් නොවේ. සාගරය යට ගිල්වා දැමිය හැකි දෙයක් නොවේ. කිසිම ලෙසකින් එසේ කළ නොහැකියි. දරුවන් වන ඔබ පියාගෙන් ඔබගේ ඒ අවිනාශී වූ රාජ්‍යයේ උරුමය හිමිකර ගැනීම සඳහා පැමිණ සිටිනවා. එහිදී, කිසිම කෙනෙක්ට තව කෙනෙක්ට දුක් දෙන්නත් බැහැ, රාජ්‍යයේ කිසිම කෙනෙක්ට ප්‍රශ්නයක් ඇති කරන්නත් බැහැ. එහි, අපහසුතාවයනට පත් කරනා කිසිවෙක් නැහැ. රාවණ් තමයි ප්‍රශ්න ගෙන එන එකම කෙනා. රාවණ්ව ඔළු දහයක් සහිතව පෙන්නුම් කරනවා. ඔවුන් රාවණ්ව එලෙසින්ම පෙන්වනවා. ඔවුන් මදෝද්‍රිව (රාවණ්ගේ භාර්යාව) පෙන්නුම් කරන්නේ නැහැ. ඇය රාවණ්ගේ භාර්යාව වන බව පමණක් ඔවුන් පවසා තිබෙනවා. මෙහිදී, රාවණ්ගේ රාජ්‍යයේදී, ඔබ නොයෙක් අපහසුතාවයන්ට මුහුණ පානවා. එහි, රාවණ් කෙනෙක් නැහැ. බාබා අශාරීරිකයි; කිසිම කෙනෙක්ට ඔහුව මරන්නත් බැහැ, තුවාල කරන්නත් බැහැ. ශරීරයක හිඳගෙනත් ඔබට කිසිම දුකක් ඇති නොකරන තත්ත්වයට ඔහු ඔබව පත් කරවනවා. එමනිසා, එවන් වූ පියෙකුගේ උපදෙස් ඔබ පිළිපැදිය යුතුයි. දැනුම් සාගරය වන්නේ බාබාම පමණයි. වෙන කිසිම කෙනෙක්ට මෙම දැනුම දිය නොහැකියි. ඔහු බ්‍රහ්මා මාර්ගයෙන් සියලු ආගමික ග්‍රන්ථවල සාරය ඔබට කියා දෙනවා. බ්‍රහ්මා ශිව බාබාගේ දරුවායි. බ්‍රහ්මා විශ්ණුගේ නාභියෙන් ඉපදුනා කියා දෙයක් නැහැ. ඔබ එසේ කිව්වා වුවත් ඔහු උපදින්නේ ශිවාගේ නෙළුම් මලක් බඳු වූ නාභියෙනි. ඔබ උපදින්නේත් ශිවාගේ නාභියෙනි. අනෙක් සෑම පින්තූරයක්ම වැරදියි. නිවැරදි වන්නේ ඒ එකම එක බාබා පමණයි. රාවණ් ඔබව නිරවද්‍යතාවයෙන් තොර පුද්ගලයින් බවට පත් කරවනවා. මෙය නාට්‍යයක්. රාවණ්ගේ රාජ්‍යය ආරම්භවන්නේ කෙසේද යන්න ගැනත්, මිනිස්සු කෙමෙන් කෙමෙන් සම්පූර්ණයෙන්ම පහළටම වැටීගෙන ආවේ කෙසේද යන්න ගැනත් තේරුම් ගන්නේ ඔබ පමණයි. කිසිම කෙනෙක්ට නැගගන්න බැහැ. පියා වෙත යාමට කියා ඔබට මාර්ගයක් පෙන්වා දෙන අය, ඊටත් එහා කැළයක් වෙත වූ මාර්ගය තමයි කියා දෙන්නේ. මන්ද, ඔවුන් පියා වෙත යන්නා වූ මාර්ගය දන්නේ නැහැ. දිව්‍යලෝකය වෙත වූ මාර්ගය දන්නේ නැහැ. සෑම ගුරු කෙනෙක්ම තම නිවෙස් අත්හැර ගිය හඨ යෝගීන්ය. බාබා ඔබට ඔබගේ නිවෙස් අත්හැර දමා යන්න කියන්නේ නැහැ. ඔහු කියනවා: පාරිශුද්ධත්වයට පත් වන්න! කුමරුන් හා කුමරියන් පිරිසිදුයි. ද්‍රෞපතීන් මෙසේ කෑගහනවා. බාබා, අපව ආරක්ෂා කර ගන්න. අපට පාරිශුද්ධත්වයට පත්වී ක්‍රිෂ්ණාගේ දේශය වෙත යාමට අවශ්‍යයි. කුමාරීන් ද මෙසේ කෑගහනවා: බාබා අපේ දෙමාපියන් අපට පීඩා කරනවා. අපට පහර දෙනවා. අපි අනිවාර්යෙන්ම විවාහ විය

යුතුයි කියා ඔවුන් කියනවා. කුමාරීන් විවාහ වීමට පෙර ඔවුන්ගේ දෙමාපියන් ඔවුන්ට වඳිනවා. මන්ද, ඔවුන් තමා අපිරිසිඳු ලෙසත්, කුමාරීන් පිරිසිඳු ලෙසත් සළකන නිසයි. ඔවුන් මෙසේ කෑගහනවා: අහෝ පාරිශුද්ධකරුවාණෙනි එන්න! බාබා කියනවා: කුමාරීන් අපිරිසිඳුවන්න එපා! එසේ නැතිනම්, ඔබට කෑගසමින් කන්නලව් කරන්න සිදුවනවා. ඔබ තමාව ආරක්ෂා කරගත යුතුයි. බාබා පැමිණ සිටින්නේ ඔබව පාරිශුද්ධත්වයට පත් කරවීමටයි. ඔහු කියනවා: මා පැමිණ සිටින්නේ ඔබට ඔබගේ දිව්‍යලෝක රාජ්‍යයේ උරුමය ලබාදීම සඳහායි. එමනිසා, ඔබ පාරිශුද්ධත්වයට පත්විය යුතුමයි. ඔබ අපිරිසිඳු වුවහොත්, ඔබ මිය යන්නේ අපිරිසිඳු තත්ත්වයේ සිටමයි. ඔබට දිව්‍යලෝකයේ සතුට අත්විඳීමට නොහැකි වනවා. දිව්‍යලෝකයේ සෑහෙන වින්දනයක් තිබෙනවා. එහි දියමන්ති හා මිණිමුතු වලින් සැදි මාළිගා තිබෙනවා. ඒ රාධේ හා ක්‍රිෂ්ණාම පසුව ලක්ෂ්මී හා නාරායන බවට පත්වනවා. එමනිසා, ලක්ෂ්මී හා නාරායනටත් එම ආදරයම තිබිය යුතුයි. හොඳයි, මිනිස්සු ක්‍රිෂ්ණාට ආදරය කරනවා, නමුත් ඔවුන් රාධේ ඉවත ලා තිබෙන්නේ ඇයි? ඔවුන් ක්‍රිෂ්ණාව තොටිල්ලක දමා නළවමින් ඔහුගේ උපත සමරණවා. මව්වරුන් ක්‍රිෂ්ණාට බොහෝ ආදරෙයි. නමුත් රාධේට එතරම් ආදරේ නැහැ. ක්‍රිෂ්ණා බවට පත්වීමට සිටින බ්‍රහ්මාත්, ඒ තරම් වන්දනාවට ලක්වන්නේ නැහැ. ඔවුන් බොහෝ සෙයින් ඒ ලෝක මාතාව (ජගදම්බා)ට වන්දනා කරනවා. ඔහු සරස්වතීයි. බ්‍රහ්මාගේ දියණියයි. පළමු දේවතාවා වන බ්‍රහ්මාට කෝවිලක් තිබෙන්නේ අජ්මීර් හී පමණයි. දැනුමේ දේවතාවිය මමායි. ඇය බ්‍රහමිණ් කෙනෙක් බව ඔබට වැටහෙනවා. ඇය දිව්‍යලෝකයේ පළමු දේවතාවිය නොවේ. ඇයට අත් අටක් ඇත්තේත් නැහැ. ඇය වෙනුවෙන් සාදා ඇති කෝවිලෙහි අත් අටක් පෙන්නුම් කර තිබෙනවා. බාබා කියනවා: මායාගේ රාජ්‍යයේ තිබෙන්නේ බොරුවම පමණක් මිස වෙන කිසිම දෙයක් නොවේ. ඒ එකම එක පියා, සත්‍යය වන ඔහු පමණයි, මනුෂ්‍යයින් දේවතාවන් බවට පත්කරවීම සඳහා සත්‍යය කතා කරන්නේ. ඒ භෞතික බ්‍රහමිණ්වරුන්ගේ කතාවලට සවන් දීමෙන් ඔබ මෙම තත්ත්වයට පත්ව සිටිනවා. මරණය දැන් ඔබ ඉදිරියේමයි. බාබා කියනවා: කලි යුගයේ අවසානයේදී වෘක්ෂය එහි සම්පූර්ණ දිරාපත්භාවයට ඇද වැටුණු විට තමයි සෑම චක්‍රයකම සංගමයේදී මා මෙහි පැමිණෙන්නේ. මා සෑම යුගයකදීම එන්නේ නැහැ. මා මාළුවන් තුළට, කිඹුලන් තුළට හෝ ඌරන් තුළට ඇතුළුවන්නේ නැහැ. මා ධාන්‍ය වර්ග තුළ ඇත්තේත් නැහැ. ජීව වන ඔබත් සෑම ධාන්‍යයක්ම තුළ නැහැ. ඉතින් මා කොහොමද ඒ තුළට යන්නේ? මනුෂ්‍ය ජීව, සත්වයන් තුළට යනවා කියා ඔවුන් කියනවා. මෙහි නොයෙකුත් ආකාරයේ කුල වර්ග තිබෙනවා. ඒවා ගණන් කරන්නවත් ඔබට බැහැ. බාබා කියනවා: මා දැන් ඔබට නිවැරදි දේවල් විස්තර කර දෙනවා. දැන් තීරණය කරන්න: උපත් මිලියන 8.4ක් තිබෙනවා කියා කීම නිවැරදිද, වැරදිද? මේ විජ්ජාවෙන් පිරි ලෝකයේ සත්‍ය වූ කිසිම දෙයක් තිබිය හැක්කේ කෙසේද? සත්‍යවාදී වන්නේ ඒ ඒකායන තැනැත්තා පමණයි. සත්‍යය හා බොරුව යන දෙක වෙන් කරලන්නේ බාබාගේ පැමිණීමෙන් පසුවයි. මායා සෑම කෙනෙක්වම ව්‍යාජ අය බවට පත්කර තිබෙනවා. බාබා පැමිණ සෑම කෙනෙක්වම සත්‍යවාදී අය බවට පත්කරවනවා. දැන් තීරණය කරන්න: නිවැරදි කවුද? ඔබගේ ගුරුන් සෑම කෙනෙක්ම නිවැරදිද, නැතිනම් නිවැරදි ඒ එකම එක බාබා පමණද? ඒ එකම එක නිරවද්‍ය වූ බාබා විසින් නිරවද්‍ය වූ ලෝකය ස්ථාපනය කරනවා. එහිදී, නීතියට පටහැනිව කිසිම දෙයක් සිදුවන්නේ නැහැ. එහිදී, කිසිම කෙනෙක් විෂ ලබන්නේ නැහැ. ඔබට වැටහෙනවා: භාරතයේ වැසියන් වූ අප අනිවාර්යයෙන්ම දේවතාවන් වූවා. අප දැන් අපිරිසිඳු බවට පත්වී සිටිනවා. මිනිස්සු කෑගහනවා: අහෝ පාරිශුද්ධකරුවාණෙනි, එන්න! රජවරුන්, රැජිණියන් හා පුරවැසියන් සෑම කෙනෙක්ම අපිරිසිඳුයි. ඉතින් මේ නිසා තමයි ඔවුන් ලක්ෂ්මී හා නාරායනට වන්දනා කරන්නේ. භාරතයේ පාරිශුද්ධත්වයෙන් යුතු වූ රජවරුන් සිටියා. දැන් ඔවුන් අපිරිසිඳු බවට පත්වී සිටිනවා. ඔවුන් දැන් අපිරිසිඳු නිසා ඔවුන් පිරිසිඳු අයට වන්දනා කරනවා. බාබා දැන් පැමිණ ඔබව අධිරාජ්‍යයින් හා අධිරාජිණියන් බවට පත්කරවනවා. එමනිසා, ඔබ උත්සාහ දැරිය යුතුයි. අත් අටකින් යුතු වූ කිසිම කෙනෙක් නැහැ. ලක්ෂ්මී හා නාරායන දෙදෙනාටම තිබෙන්නේ අත් දෙක බැගිනි. ප්‍රතිමාවල ඔවුන් නාරායන අවලස්සන ලෙසත්, ලක්ෂ්මී ලස්සන ලෙසත් පෙන්නුම් කර තිබෙනවා. එක් කෙනෙක් පිරිසිඳු වන්නටත්, අනෙක් කෙනා අපිරිසිඳු වන්නටත් හැක්කේ කෙසේද? ඉතින්, ඒ පින්තූරවල පෙන්වා තිබෙන දේවල් වැරදියි. බාබා විස්තර කරනවා: රාධේ හා ක්‍රිෂ්ණා දෙදෙනාම ලස්සනයි. පසුව, රාගයේ ගින්නෙහි අසුන් ගැනීම නිසා දෙනොම අවලස්සන වූවා. අනෙක් කෙනා අවලස්සන වී සිටියදී එක්කෙනෙක් ලස්සන විය නොහැකියි. ක්‍රිෂ්ණා හැඳින්වෙන්නේ ශ්‍යාම් සුන්දර් (අවලස්සන හා ලස්සන කෙනා) ලෙසයි. ඔවුන් රාධේ ශ්‍යාම් සුන්දර් ලෙස හඳුන්වන්නේ නැත්තේ ඇයි? ඇයි මෙසේ වෙනසක්? ජෝඩුවක් කිව්වහම දෙදෙනාම එකම විය යුතුයි. ඔබ දැන් අසුන්ගෙන සිටින්නේ දැනුම නම් වූ ගින්නෙහියි. ඉතින් ඇයි ඔබ ගිහින් රාගයේ ගින්නෙහි අසුන් ගන්නේ? ඔබගේ දරුවන්වත් මෙම උත්සාහයෙහි යොදවන්න: අප දැන් අසුන්ගෙන සිටින්නේ දැනුම නම් වූ යාගයේයි. ඉතින්, ඇයි ඔබ ගිහින් රාගයේ ගින්නෙහි ඉඳ

ගන්නේ? ස්වාමිපුරුෂයා දැනුම ලබාගෙන භාර්යාව දැනුම ගන්නේ නැතිනම්, එහි සටනක් ඇතිවනවා. මෙම අත්හැරීමේ ගින්නට සැහෙන බාධක එල්ල වනවා. මෙම දැනුම ඉතා විශාලයි. මේ රුද්‍රාගේ යාගය ඇරඹුණේ බාබා පළමු වතාවට මෙහි පැමිණි විටයි. ඔබ බ්‍රහමිණ්වරුන් වන තෙක් ඔබට දේවතාවන් බවට පත්වන්න බැහැ. අපිරිසිඳු ශුද්‍ර තත්ත්වයෙන් පිරිසිඳු දේවතා තත්ත්වයට පත්වීමට, ඔබ බ්‍රහමිණ් කෙනෙක් බවට පත්විය යුතුයි. මෙම අග්නි යාගය ගෙන යන්නේ බ්‍රහමිණ්වරුන්. මෙම අග්නි යාගයේදී ඔබ පාරිශුද්ධත්වයට පත්විය යුතුමයි. කොහොමනමුත්, ඔබ අනෙක් මිනිස්සු කරන්නා සේ බාර්ලි හෝ තිරිඟු ඇට එකතු කිරීමක් මෙහිදී කරන්න අවශ්‍ය නැහැ. අපහසුතාවයකට පත්වූ අවස්ථාවලදී මිනිස්සු යාගහෝම කරනවා. දෙවියනුත් එවැනි යාගහෝමයක් කරනවා කියා ඔවුන් සිතනවා. බාබා කියනවා: මෙය තමයි ඔබ බිල්ලක් දෙන්නා වූ දැනුම නම් වූ දැනුමේ යාගහෝමය. ඔබ තම ශරීරය ද ඇතුළුව සියලුම දේ කැප කළ යුතුයි. මුදල් ආදිය දැමීමක් අවශ්‍ය වන්නේ නැහැ. මෙහිදී සෑම දෙයක්ම ඔබ කැප කළ යුතුයි. මේ ගැන කතන්දරයකුත් තිබෙනවා: දක්ෂා ප්‍රජාපිතා අග්නි යාගයක් කළා. ප්‍රජාපිතා බ්‍රහ්මා කියා ඉන්නේ එකම එක තැනැත්තායි. එසේනම්, දක්ෂා ප්‍රජාපිතා පැමිණියේ කොහි සිටද? බාබා ප්‍රජාපිතා බ්‍රහ්මා මාර්ගයෙන් මෙම අග්නි යාගය නිර්මාණය කරනවා. ඔබ සෑම කෙනෙක්ම බ්‍රහමිණ්වරුන්. ඉතින් ඔබ තම සීයාගෙන් උරුමයක් ලබනවා. ඔබ කියනවා: ඔබ බ්‍රහ්මා බාරේ ශිව බාබා ළඟට පැමිණ සිටිනා බව. මෙය ශිව බාබාගේ තැපැල් කාර්යාලයයි. ඔබ ලියුමක් ලියන විට, මෙසේ ලියනවා: බ්‍රහ්මා බාරේ, ශිව බාබාට. බාබා වාසය කරන්නේ මොහු තුළයි. මේ සෑම බ්‍රහමිණ්වරයෙක්ම පාරිශුද්ධත්වයට පත්වීම සඳහා දැනුම හා යෝගා ඉගෙන ගන්නවා. අපි අපිරිසිඳු නැහැයි කියා ඔබ කියන්නේ නැහැ. අපි අපිරිසිඳුයි. නමුත් ඒ පාරිශුද්ධකරුවා විසින් අපව පාරිශුද්ධත්වයට පත්කරවනු ලබනවා. ඒ කිසිම මනුෂ්‍යයෙක් පිරිසිඳු නැහැ. මේ නිසා තමයි ඔවුන් ගංගා වෙත ගොස් ස්නානය කරන්නේ. අප පාරිශුද්ධත්වයට පත්කරන්නේ, ඒ බාබා සත්ගුරු පමණයි යන්න ගැන ඔබ දැන් දන්නවා. ඔහුගේ ශ්‍රීමත් එක වන්නේ: දරුවනි, ඔබගේ බුද්ධියෙහි සම්බන්ධය මා හා පමණක් සම්බන්ධ කර ගන්න. ඔබට කැමති නම් ගිහින් ගුරුන්ව අනුගමනය කළ හැකියි. නැතිනම්, මගේ උපදෙස් පිළිපැදිය යුතුයි. ඔබම තීරණයක් ගන්න. පියා, ගුරුවරයා හා සත්ගුරු ඔබෙයි. ඒ අසීමිත වූ පියා සෑම මනුෂ්‍යයෙක්ටම මෙසේ කියනවා: ජීව අවධානයට පත්වන්න. දේවතාවන් ඉන්නේ ජීව අවධානයෙන්. මෙහි සිටින කිසිම කෙනෙක්ට මෙම දැනුම නැහැ. ජීවයක් කියන්නේ උත්තරීතර ජීවයයි කියාත්, ජීවය බ්‍රහ්මා ආලෝකය වෙතට යනවා කියාත් සන්‍යාසීන් කියනවා. එවැනි දේට සවන් දීමෙන් ඔබ බොහෝ අසතුටටත්, දූෂිත බවටත් පත්වී තිබෙනවා. දූෂිත වූවන් යනු විෂෙන් ඉපදුණු අයයි. රාවණ්ගේ රාජ්‍යයේ සෑම කෙනෙක්ම කරන්නේ දූෂිත වූ ක්‍රියාවන්. පසුව බාබා පැමිණ ඔබව ලස්සන මල් බවට පත්කරවනවා. ඔහු එන්නේ භාරතයට පමණයි. බාබා කියනවා: මා ඔබට දැනුම හා යෝගා උගන්වනවා. මීට අවුරුදු පන්දහසකට ප්‍රථම ඔබට මෙය උගන්වා ඔබව දිව්‍යලෝකයේ පාලකයන් බවට පත්කෙරෙව්වා. ඒ වගේම මා දැන් නැවතත් ඔබව එම තත්ත්වයට පත්කරවනවා. සෑම චක්‍රයකදීම මා නොකඩවාම එනවා. මෙයට ආරම්භයක් හෝ අවසානයක් හෝ නැහැ: මෙම චක්‍රය දිගින් දිගටම කැරකෙනවා. මෙහිදී සමූල ඝාතනයක් සිදුවන්නේ නැහැ. මේ කාලයේදී දරුවන් මේ අවිනාශී වූ දැනුම් මිණිමුතු වලින් ඔබගේ මලු පුරවා ගන්නවා. තම මලු පුරවා දෙනුයේ ශිව බාබායි කියා ඔවුන් කියනවා. ඒ කියන්නේ ඔහු ඒ භක්ගෙඩිය පිඹ ඔබගේ මලු පුරවාලනවා. දැනුම පවතින්නේ ඔබගේ බුද්ධිය තුළයි. ජීවය සංස්කාර වලින් පිරිලා. අධ්‍යාපනය ලබා ඉංජිනේරුවරයෙක් හෝ නීතිඥවරයෙක් වන්නේ ජීවයයි. දැන් ජීව වන ඔබ පත්වන්නේ කුමන තත්ත්වයකටද? ඔබ කියනවා: බාබා, අප අපගේ උරුමය ලබාගෙන ලක්ෂ්මී හා නාරායන බවට පත්වනවා. ජීව අනිවාර්යෙන්ම නැවත නැවතත් උපත් ලබා ගන්නවා. මේ කැරණු සඳහා වටහා ගැනීම අත්‍යවශ්‍යයි. කෙනෙකුගේ කනට මේ වචන දෙක මුමුණන්න: ඔබ ජීවයක්. ශිව බාබා සිහිපත් කරන්න. එවිට ඔබ දිව්‍යලෝක රාජ්‍යය හිමිකර ගනු ඇත. එය ඉතාමත් පහසුයි! ඔබට සත්‍යය පවසන්නේ ඒ එකම එක පියා පමණයි. ඔහු සෑම කෙනෙකුටම විමුක්තිය ලබා දෙනවා. අනෙක් සෑම කෙනෙක්ම ඔබට බොරු කියා පරිහාණියක් පමණයි සිද්ධ කරන්නේ. ඒ ආගමික ග්‍රන්ථ ආදී සියල්ල නිර්මාණය වූයේ පසුවයි. භාරතයේ තිබෙන්නේ එකම එක ආගමික ග්‍රන්ථයයි. ඒ ගීතාවයි. ලෝකය පටන්ගත් දා සිට ඒවා තිබෙනවා කියා මිනිස්සු කියනවා. නමුත් ඒ කවදා සිටද? ලෝකය අවුරුදු සියදහස් ගණනක් පැවතුනා කියා ඔවුන් සිතනවා. අච්චා. දරුවන් බාබාට මිදි රැගෙන එනවා. දරුවන් තමයි ඒවා ගේන්නේත්, ඔබම තමයි ඒවා කන්නේත්. මම ඒවා කන්නේ නැහැ. මම අභෝග්තායි (ක්‍රියාවන්හි ඵල අත්විඳීමෙන් මිදුණු). සත් යුගයේදී මා ඔබ වෙනුවෙන් මාළිගා තණනවා. මෙහිදීත්, මා ඔබට වාසය කිරීමට අලුත් මාළිගා දෙනවා. නමුත් මම ඉන්නේ පරණ පැළකයි. මේ බාබා ඉතාමත් පුදුම සහගතයි. ඔහු පියා වන්නා සේම, අමුත්තෙක් ද වනවා. මා බොම්බායට ගියහොත් ඔවුන් මා අමුත්තෙක් ලෙස සළකයි. මොහු තමයි මේ මුළු ලෝකයටම සපැමිණි ලොකුම අමුත්තා.

මෙහි ඇවිත් යන්න ඔහුට එතරම් කාලයක් ගතවන්නේ නැහැ. ඔහු පුදුම සහගත අමුත්තායි! ඒ ඈත දනව්වෙහි වාසය කරනා ඔහු මේ විදේශ රටකට පැමිණ සිටිනවා. එමනිසා, ඔහු තමයි අමුත්තා. ඔහු ඔබව ලස්සන මල් බවට පත්කරවීමට මෙහි එනවා. ඔබට ඔබගේ උරුමය ලබා දී බෙලි කටු මෙන් සිටිනා ඔබව දියමන්ති බවට වෙනස් කිරීමට ඔහු මෙහි එනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මේ අවිනාශී වූ දැනුම් මිණිමුතු ධාරණය කරගෙන දැනුමේ හක්ගෙඩිය පිඹින්න. සෑම කෙනෙකුටම මේ දැනුම් මිණිමුතු ලබා දෙන්න.
2. සත්‍යය හා ව්‍යාජත්වය අතර ඇති වෙනස හඳුනාගෙන සත්‍යය අනුගමනය කරන්න. නීතියට පටහැනි වූ කිසිම ක්‍රියාවක් කරන්න එපා.

**වරදානය:** ඔබ ඔබේ බුද්ධිය කාර්යක්ෂමව තබාගැනීම මගින් නිරන්තරව බලවත් වෙමින් සියලු අපත අවසන් කරත්වා.
තම බුද්ධිය කාර්යක්ෂමව තබාගැනීමේ ක්‍රම වේදය භාවිත කරන්නන් නිරන්තරයෙන් බලවතුන් බවට පත්වෙනවා. සියලු අපතයන් පහසුවෙන් අවසන් කර දැමීම සඳහා සහ බලවත් වීම සඳහා පහසු මාර්ගය වන්නේ සදා කාර්යක්ෂම වී සිටිමය. එබැවින්, හුදෙක් ඔබ සෑම උදෑසනකම එදිනට භෞතික කාලසටහනක් සාදාගන්නා සේම ඔබේ බුද්ධිය කාර්යක්ෂමව තබාගැනීම සඳහාත් කාලසටහනක් සාදන්න: මේ මොහොතේ, මෙම බලවත් සිතිවිල්ලක් මාගේ බුද්ධියෙහි තබාගෙන සියලු අපතයන් අභවර කරනවා. ඔබ කාර්ය බහුලව සිටිද්දී මායා දුරින්ම ඈත්ව යනවා ඈත.

**පාඨය:** දුක් ලෝකය අමතක කිරීම සඳහා සදා දෙවියන්ගේ සෙනෙහසෙහි නිමග්නව සිටින්න.

***** ඕම් ශාන්ති *****